TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබෑන්ක් පාර,
කොළඹ 5

16 ඔක්තෝබර් 2019.

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජයේ නිලධාරීන් සහභාගී වීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සම්බන්ධවයි.</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත ලැබුණු පැමිණිල්ලකට අනුව 2019.10.15 දින පස්වරු 2.30 ට පමණ එක්සත් ජාතික පක්ෂය විසින් මාතර දිස්ත්‍රික් කඹුරුපිටිය ආසන බල මණ්ඩල රැස්වීම පැවැත් වූ අතර ඒ සඳහා රජයේ නිළධාරීන් දෙදෙනෙකු වූ ලංකා පිහන් සංස්ථාවේ සභාපතිවරයා සහ නිවාස සංවර්ධන අධිකාරියේ මාතර ශාඛාවේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරියෙකු සහභාගී වී ඇත. මීට අදාළ ඡායාරූප මේ සමඟ අමුණා ඇත. තව ද මේ සම්බන්ධයෙන් මාතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පැමිණිලි අංශයට පැමිණිල්ලක් එදිනම සිදුකරන ලදී.

මෙසේ රජයේ නිලධාරීන් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා සහභාගීවීම මගින් 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 2 (i) යන නියමය උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා ඌව පළාත් සම්බන්ධීකාරක ධනුක ලක්මාල් හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.
මෙයට,

විශ්වාසී,

Lakvijaya Bandara
.............................
ලක්විජය බණ්ඩාර

ජාතික සම්බන්ධීකාරක [PPPR]

Reg No. GA 273 Chairperson: S.C.C. Elankovan Directors: Anushika Amarasinghe Shyamala Gomez K. W. Janaranjana Gehan Gunatilleke Camena Guneratne
Company Secretary: Chandri Gunawardana Shreen Saroor T. Someswaran Tony Senewiratne Pulasthi Hewamanna Pavithra Kailasapathy







